# පහතරට බිතුසිතුවම් වලින් හෙළිවන වාස්තුවිද්‍යාත්මක ලක්‍ෂණ (කරගම්පිටිය සුබෝධාරාම හා කෝට්ටේ රජමහා විහාර ආශ්‍රිත)

**ඒ.කේ.ආර්. මධුමාලි**
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය.
*rangikathilakarathna8@gmail.com*

ප්‍රමුඛ පද : පහතරට සිතුවම් කලාව, වාස්තු විද්‍යාව, විදේශීය, දේශීය

**හැඳින්වීම**

ශ්‍රී ලංකාව විශිෂ්ට සිතුවම් කලා සම්ප්‍රදායකට උරුමකම් කියන රටක් බවට පවතින සාහිත්‍යගත තොරතුරුවලින් මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ගෙන් ද අනාවරණය වේ. මානව ආකල්ප හුවමාරු කරගනු ලබන දෘශ්‍ය මාධ්‍යක් වශයෙන් අපට සිතුවම් කලාව හැඳින්විය හැකිය. ක්‍රිස්තු වර්ෂ 16 ක්‍රි.ව 17 සියවස්වල සිට ක්‍රි.ව. 18 වන සියවස දක්වා වූ මහනුවර යුගයේ දී ලංකාවේ සිතුවම් කලාවේ වෙනස්ම සම්ප්‍රදායක් බිහි වු යුගයක් වශයෙන් හඳුනාගත හැකි ය. ක්‍රි.ව. 1505 දී පෘතුග්‍රීසීන්ගේ පැමිණීම හේතුවෙන් ලක්දිව රාජ්‍ය බලයේ යම් යම් ගැටලුකාරී තත්ත්ව පැන නැගිනි. පෘතුග්‍රීසි බලය පතුරවා ගන්නා ලැබූ පහතරට ප්‍රදේශයේ මේ හේතුවෙන් විහාර බොහෝමයක් විනාශ වන්නට විය. වැලිවිට සරණංකර හිමියන්ගේ අනුශාසනකත්වය හා කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මූලිකත්වයෙන් පැරණි විහාර ප්‍රතිසංස්කරණයත් විහාර ආශ්‍රිත සිතුවම් කර්මාන්තය ආරම්භ කිරීමත් සිතුවම් කලාවට නව මඟක් උදා විය. ප්‍රාදේශීය සිත්තර පරම්පරාවන් ගෙන් පෝෂණය වූ මෙම පහතරට සිතුවම් කලාව තුළ දේශීය මෙන් ම බටහිර රටවල සංස්කෘතියේ ලක්‍ෂණ යම් දුරකට සිතුවම් අතර දක්නට ලැබේ. දකුණු ප්‍රදේශයේ කලා ශිල්පීන් 19 වන සියවස වන විට උසස් කලා සම්ප්‍රදායන් වර්ධනය කර තිබූ බව මහාචාර්ය සේනක බණ්ඩාරනායකගේ මතය වේ.

මෙම විහාරවල සිතුවම් අතර දක්නට ලැබෙන වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ භාවිතා කර ඇති ආකාරයත්, එහි පවතින විශේෂතාත් මෙහි දී අධ්‍යයනය කරනු ලැබේ. එහි දී ගොඩනැගිලි නිරූපනය වන අයුරු ගොඩනැගිලිවල අංගෝපාංග හා ගොඩනැගිලි අලංකාරය සඳහා සැරසීමට යොදා ඇති මෝස්තර රටා ද මෙහ දී අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ.

මෙම පහතරට සිතුවම් බොහෝමයක් දක්නට ලැබෙන්නේ විහාරයේ ප්‍රතිමාගෘහ ආශ්‍රිතව ය. විහාරයේ ප්‍රතිමාගෘහයේ බිත්ති තිරස් පනේල ආකාරයට බෙදා එහි දේව රූප, ශ්‍රාවක රූප, ජාතක කථා, බුදු සිරිතේ සිදුවීම් හා ශාසන ඉතිහාසය ආදී කරුණු සිතුවම් කර ඇත. මෙහිදී සිද්ධි හා අවස්ථා පැහැදිලිව විස්තරාත්මකව අඛණ්ඩ රූප කථනයකින් නිරූපනය කිරීමේ හැකියාව පහතරට සිත්තරුන්ගේ සිතුවම් අධ්‍යයනයේ දී පැහැදිලි වේ. මෙම කථාවන්හි දක්වෙන විවිධ සිද්ධි නිරූපනයේ දී භාවිත කරනු ලබන ගොඩනැගිලි මහනුවර යුගයේ සිතුවම් අතරින් පහතරට සිතුවම් වල විවිධත්වයක් දකිය හැකිය. මහනුවර යුගයේ හා ඊට පෙර සිතුවම්වලට වඩා තරමක් සංකීර්ණ වු වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ මෙහිදී පහතරට සිතුවම් තුළ දක්නට ලැබේ. වහලයේ හැඩය, උළුවල වෙනස, කණුවල ස්වභාවය, මෝල්ඩින් (බොරදම්), දොර ජනෙල් වල ස්වභාවය, මහල් නිවාස, බීරළු වැට, තාප්ප, ආලින්දය ආදී විවිධ අංග දකිය හැකි ය. එම සිතුවම් එකිනෙකට වෙනස් ව නිර්මාණය කර තිබීම ද විශේෂත්වයක් වේ.

ජාතක කථා නිරූපනයේ දී මෙ ලෙස යොදා ගෙන තිබෙන වාස්තුවිද්‍යාත්මක අංග එම කථාවේ අර්ථය හා සම්බන්ධවන ආකාරයත්, එහි උපාංග නිරූපනය කර තිබෙන ආකාරයත් විශේෂ වේ.මෙයට හේතු වශයෙන් සිතුවම් නිර්මාණය වු කාල වකවානුවත්, එකල පැවති අත්දැකීම් හා සිත්දැකීම් අනුවත් ප්‍රාදේශීය සිත්තරුවන් ඔවුන්ගේ දක්ෂතාවන් මත තාත්ත්වික ව එම සිතුවම් අතර ගොඩනැගිලි සිත්තම් කර ඇත.

මේ සිතුවම් අතර ඇති ලක්‍ෂණ හා එහි නිරූපිත අංග බොහෝමයක් සමකාලීන සමාජය වෙනස් වු ආකාරයත් එයට හේතු ආදියත් අධ්‍යයනය කළ හැකි වේ.මේ අනුව මෙම පර්යේෂණ පත්‍රිකාවට පාදක කරගන්නා විහාර වශයෙන් කරගම්පිටිය සුබෝධාරාම විහාරය හා කෝට්ටේ රජමහා විහාරය ආශ්‍රිත සිතුවම් අතර දක්නට ලැබෙන වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ පිළිබඳ කරුණු අනාවරණය කි.

**ක්‍රමවේදය**

පහතරට සිතුවම් අතර දක්නට ලැබෙන වාස්තුවිද්‍යාත්මක ලක්‍ෂණ යන මාතෘකාව ඔස්සේ පර්යේෂණය සිදු කිරීමේ දී ප්‍රධාන වශයෙන් දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය සඳහා ප්‍රථමික හා ද්විතික මූලාශ්‍ර, පූර්ව පර්යේෂණ අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය සිදුකරනු ලැබීය.

පහතරට සිතුවම් අතර දක්නට ලැබෙන වාස්තුවිද්‍යාත්මක ලක්‍ෂණ යන මාතෘකාව යටතේ ඉදිරිපත් කරන මෙම පර්යේෂණ පත්‍රිකාවේ දත්ත විශ්ලේෂණයට සිතුවම් වල දක්නට ලැබෙන වාස්තුවිද්‍යාත්මක ලක්‍ෂණ පහතරට දක්නට ලැබෙන දේශීය හා විදේශීය වාස්තුවිද්‍යාත්මක සම්ප්‍රදායන්ගේ ලක්‍ෂණ සමඟ සන්සන්දනය කරමින් විමර්ශනය කරනු ලැබේ. මෙහි දී මූලික වශයෙන්

මහනුවර සම්ප්‍රදාය හඳුනාගන්නා ලක්ෂණ මඟින් පහතරට ප්‍රදේශයේ ඇති මෙම විහාරවල ඇති සිතුවම්වල ලක්ෂණ සන්සන්දනය කරනු ලබන අතර එහිදී පහතරට සිතුවම් කලාවේ විශේෂතා හඳුනා ගැනීමත් එම සිතුවම්වල ඇති වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ වල ආභාසය මූලාශ්‍ර තොරතුරු හා පුරාවිද්‍යාත්මක තොරතුරු අනුව විශ්ලේෂණය කරමින් එහි ලක්ෂණ හඳුනාගැනීමට සිදුකරනු ලැබේ.

## ප්‍රතිඵල

ලාංකේය ජනජීවිතයේ සෑම අංශයක්ම සංවර්ධනය කිරීමේ වගකීම පැවරෙන්නේ භික්ෂූන් වහන්සේට ය. බුදු දහම කියා දීම පමණක් නොව, බෞද්ධ ප්‍රතිපත්ති අනුව ජන ජීවිතය හැඩ ගැස්වීමේ වගකීම පැවරුනේත්, උන්වහන්සේට ය. මේ ඓතිහාසික වගකීම ඉටුකිරීම සඳහා උපයෝගී කරගත් ප්‍රබල මාධ්‍යයක් වූයේ විහාර චිත්‍ර රචනය යි. මෙම චිත්‍රවල වස්තු විෂය ලෙස තෝරාගනු ලැබුවේ ජාතක කතා, බුදු සිරිතේ වැදගත් අවස්ථා හා ශාසන ඉතිහාසයේ සිදු වීම් ය.

මේ හේතූන් නිසා මෙම ප්‍රදේශයේ බොහෝමයක් සංස්කෘතික ලක්ෂණවල දේශීය මෙන්ම විදේශීය සංස්කෘතික ලක්ෂණවල ආභාසයෙන් සම්මිශ්‍රණය වූ සංස්කෘතියක් මෙම ප්‍රදේශයේ දැකගත හැකි වේ. මෙහි දී ශ්‍රී ලංකාවේ පැවති සාම්ප්‍රදායික ගෘහ නිර්මාණ ක්‍රමවලට නව ආරක ලක්ෂණ එකතු වුණි. පහතරට ප්‍රදේශයේ පැවති තාවකාලික දේශීය අමුද්‍රව්‍ය යොදාගෙන ඉදි කරන ලද කටුමැටි බිත්ති සහිත ගොඩනැගිලි වෙනුවට වඩාත් කල්පවතින පරිදි ශක්තිමත් ද්‍රව්‍ය යොදා ගනිමින් සැලැස්මකට අනුව ගොඩනැගිලි ඉදිකිරීමේ ක්‍රමයක් බටහිර ජාතීන් විසින් හඳුන්වා දෙනු ලැබීම මෙ රට වාස්තුවිද්‍යා ඉතිහාසයේ වැදගත් සිදුවීමක් බව සඳහන් කළ හැකි ය. මෙම වාස්තුවිද්‍යාත්මක අංග දේශීය පරිසරයට ගැලපෙන අයුරින් වෙනස් කර ගොඩනැගිලි ඉදිකරනු ලැබීය.

මෙම ලක්ෂණය පෙන්නුම් කරනු ලබන ගොඩනැගිලිවලට අමතරව ඒ හා සම්බන්ධ දෘශ්‍ය සාධක පහතරට සිතුවම් කලාව තුළ දැකිය හැකි ය. මෙහිදී දේශීය වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ මෙන්ම විදේශීය වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ සම්මිශ්‍රණය කරමින්, කලාත්මක මෝස්තර රටාවන් ද එක් කරමින් ඉතා විචිත්‍රවත් අයුරින් මෙම ගොඩනැගිලි නිර්මාණය කර තිබේ.

මෙහි දී ප්‍රධන වශයෙන් දක්වා ඇති ගොඩනැගිලි වශයෙන් බුදුරජාණන් වහන්සේ වැඩසිටින ගන්ධ කුටි, ස්තූප, රජ මාළිගා, සිටු මැදුරු, බමුණන්ගේ වාසස්ථාන, අම්බලම්, සල්පිල්,දානශාලා ආදී අංග සිතුවම් අතර දැකිය හැකි වේ. මේවා එකිනෙකට වෙනස් වර්ණවලින්, හැඩතලවලින් හා මෝසතරවලින් යුක්තව සිතුවම් කර තිබේ. මෙහි දී එකම ගොඩනැගිල්ල වුව ද විවිධ වෙනස්කම් සහිතව ද දක්වා ඇත. මෙම ගොඩනැගිලිවල මූලික වශයෙන් වහලය හා ඒ ආශ්‍රිත වාස්තු

විද්‍යාත්මක අංග, පෙන්ඩිමන්ට්, පෝටිකෝව, සඳළුතලය, වැට, කුළුණු, දොර ජනෙල්, කවුළු. තාප්ප ආදී බොහෝමයක් අංග සිතුවම්වල විවිධ හැඩවලින් යුක්තව සිතුවම් කර තිබේ. මෙම අංගයන් එකිනෙකට වෙනස් අයුරින් සිතුවම් කර ඇති අතර ඒවා විවිධ අර්ථ නිරූපණයන්ට සමාන අයුරින් කැටයම් එකතු කරමින් සිතුවම් කර ඇත.

මෙහි දී දැකිය හැකි විශේෂ ලක්‍ෂණ වශයෙන් දේශීය මෙන් ම විදේශීය වාස්තුවිද්‍යාත්මක අංග සහිත ගොඩනැගිලි සිතුවම් අතර දැකිය හැකි වීම ය. මෙහි දී බටහිර වාස්තුවිද්‍යාත්මක ලක්‍ෂණ, යටත් විජිත යුගවල දී මෙරටට උරුම වූ ලක්‍ෂණ වශයෙන් හඳුනාගත හැකි වේ. පහතරට ප්‍රදේශයේ දේශීය මෙන්ම විදේශීය වාස්තුවිද්‍යාත්මක ලක්‍ෂණ එකට දැකිය හැකි වූ අතර බටහිර වාස්තුවිද්‍යාත්මක අංග එම ප්‍රදේශයේ බහුලව දැකිය හැකි වේ. පහතරට සිත්තර පරම්පරාවන් ප්‍රාදේශීය සම්ප්‍රදායන් උරුමකරගත් සිත්තම් කලාවක් නිර්මාණය කළ පිරිසක් වන අතර සමකාලීන අංග සිතුවම් අතර දැක්වීමට ඔවුන් කටයුතු කර ඇති බව දැකිය හැක. පහතරට සිතුවම් තුළ බටහිර වාස්තුවිද්‍යාත්මක ලක්‍ෂණ දැකිය හැකි අතර එයින් සමකාලීන වාස්තුවිද්‍යාත්මක අංග ද නිරූපණය කරනු ලැබේ. බටහිර වාස්තුවිද්‍යාවේ අංග අධ්‍යයනය කිරීම සඳහා ඉතා වැදගත් හා විශ්වාසදායික මූලාශ්‍රයක් ලෙස පහතරට සිතුවම් පෙන්වා දිය හැකි වේ. මෙම සිතුවම් අතර දක්නට ලැබෙන වාස්තුවිද්‍යාත්මක අංගවල විවිධ ආභාසයන්ගේ ලක්‍ෂණ බලපෑම ලැබී ඇත. මෙය අදාල විහාරස්ථානවල ඓතිහාසික තත්ත්වයෙන් ද එය පැහැදිලි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


සිල්වා, රෝලන්ඩ්, නන්දන චුටිවොංග්ස් සහ ලීලානන්ද ප්‍රේමතිලක (1990) *'කරගම්පිටිය' ශ්‍රී ලංකා බිතුසිතුවම්,* මධ්‍යම සංස්කෘතික අධිකාරිය, රජයේ මුද්‍රණාලය, කොළඹ.

අමරසේකර, ඒ.ඒ.ඩී.(2004) 18, 19 වන සියවස්වල ලාංකීය ගෘහනිර්මාණ ශිල්පයේ විශේෂ ලක්‍ෂණ, සංස්: ප්‍රිශාන්ත ගුණවර්ධන, *සේනක බණ්ඩාරනායක උපහාර ග්‍රන්ථය,* ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

විජේසේකර, නන්දදේව(1964)*පැරණි සිංහල බිතුසිතුවම්,* ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

Bandaranayake, Senaka(1986)*The Rock and Wall Painting of Sri Lanka*, Lakehouse Investment (Pvt)Ltd, Colombo.

Sansoni, Babara: Laki Senanayake &Ronald Lewcock; (1998)*The Architecture of an Island*, Bapefood (Pvt)Ltd, Colombo.